
SINHALA – *"The Two Roads"*

# මාර්ග දෙක



**මාර්ගය තෝරා ගැනීම :** අප යම් ස්ථානයක් කරා සංචාරයක් යාමට පෙර යා යුතු මාර්ගය කුමක්දැයි විමසා බැලිය යුතුය. ගමන් ගන්නා කල්හි අපගේ දෙනෙත් හොඳින් යොමු කර වැරදි මාර්ගයක ගමන් ගන්නේ නම් හැරී විත් නිවැරදි මාර්ගය තෝරා ගත යුතුය.
අප දිනපතා අපගේ ජීවිතයේ මේ ලෝකය තුළින් සදාකාලය කරා ගමන් ගනිමින් සිටිමු. කිසිදා කෙළවර නොවන්නා වූ ඉරනම් ගමනෙහි ගමනාන්තය කරා ළඟා වූ කල්හි එය කිසි විටෙක වෙනස් කළ නොහැක. ඔබ යන්නේ කොයිබටදැයි ඔබ දන්නේ ද?

**අපේ මාර්ගෝපදේශක ග්‍රන්ථය :** දෙවියන් වහන්සේ එතුමන් ගේ අතිමහත් ප්‍රේමය පෙර දැරිව අපට '' බයිබලය'' නමින් වූ මාර්ගෝපදේශක ග්‍රන්ථයක් දී ඇත්තාහ. ස්වර්ගය කරා යන්නා වූ මාවත එහි පැහැදිලිවම දක්වා තිබේ. මෙම පත්‍රිකාවේ සඳහන් ලියවිලි පාඨයන් එම ග්‍රන්ථයෙන් උපුටා ගනු ලැබ ඇත. '' ඔබගේ වචන මාගේ පාදයන්ට පහනක්ය. මාගේ මාවතට එළියක් ය. '' (ගීතාවලිය 119 : 105)

**පළල් මාර්ගය :** වර්තමානයේ බොහෝ දෙනෙක් මෙම පළල් මාර්ගයේ ගමන් කරමින් සිටිති. '' මක්නිසාද විනාශයට (නිරය) යන දොරටුව විශාලය, පාරත් පළලය, එයින් ඇතුල්වන්නෝද බොහෝය. '' (මතෙව් 7:13) බොහෝ දෙනකු ගේ දෙනෙත් වැසී තිබේ. ඔවුන් නොදැන්වත්ව හෝ නොසැලකිල්ලෙන් හෝ මෙම විනාශයේ මාර්ගයේ ගමන් ගනිමින් සිටිති. '' මනුෂ්‍යයෙකුට හරිව පෙනෙන මාර්ගයක් ඇත එහෙත් එහි කෙළවරෙහි මරණයේ මාර්ග තිබේ. '' (හිතෝපදේශ 14 : 12 ) '' ..... මේ ලෝකයේ දෙවියා ( එනම් යක්ෂයා ) ඔවුන්ගේ සිත් අන්ධ කළේය." (2 කොරි. 4:4)

**පාපයේ බර :** පළල් මාර්ගයේ ගමන් කරනා සෙනග **"පාපය" නැමති බර උසුලාගෙන** යමින් සිටිති. '' සියල්ලෝම පව් කොට දෙවියන් වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති.'' (රෝම 3: 23) දෙවියන් වහන්සේ වෙතින් එක පාපයක් හෝ සැඟවිය නොහැක. '' මනුෂ්‍ය තෙමේ පිටාතර පෙනුම බලන්නේය. නමුත් ස්වාමින් වහන්සේ සිත බලන සේක. '' (1 සාමුවෙල් 16 : 7) විවිධාකාර බර ඔවුන්ගේ පිටේ බැඳ තිබේ. අපේම ශක්තියෙන් එක පව් බරකින් හෝ අපට නිදහස් විය නොහැක. කාලය ගතවනවාත් සමග එහි බර ද ක්‍රමයෙන් වර්ධනය වේ. පාපය එහි මිල ගෙවනු ලබයි. '' පාපයේ කුලී නම් මරණයය. '' (රෝම 6 : 23)

**විදුලි කෙටීම :** රූපයේ පෙන්වන **විදුලි කෙටීමෙන්** පෙන්නුම් කරනු ලබන්නේ දෙවියන් වහන්සේ ගේ **විනිශ්චයය.** '' තවද, එක වරක් මරණයත්, ඉන් පසු විනිශ්චයත් මනුෂ්‍යයන්ට නියමව තිබෙන්නාක් මෙන් ම,.... (හෙබ්‍රෙව් 9 : 27) '' තව ද මහත් සුදු සිංහාසනයක් ද, එහි වැඩහුන් තැනැන් වහන්සේ ද දුටිමි. .... මළා වූ ලොකු අය ද කුඩා අය ද සිංහාසනය ඉදිරියෙහි සිටිනවා දුටිමි. පොත් ද දිග හරිනු ලැබුවේය. ජීවන පොත වන තවත් පොතක් දිග හරිනු ලැබීය. මළා හු තමුන්ගේ ක්‍රියා ලෙස පොත් වල ලියන ලද දේ වලින් විනිශ්චය කරනු ලැබුවෝය. ... යමෙකු ගේ නම ජීවන පොතෙහි ලියා නැති බව සම්බ වීද, ඔහු ගිනි විලට හෙළනු ලැබුවේය. '' (එළිදරව් 20 : 11,12,15)

**ගිනිදැල් :** දෙවියන් වහන්සේ ශුද්ධව ධර්මිෂ්ඨව සිටින නිසා පාපයට දඬුවම් කරනු ලැබිය යුතුය. දෙවියන් වහන්සේට කීකරු නොවන්නා වූ පව් කාරයින් ට දඬුවම් කරන්නා වූ '' නිරය '' නම් ස්ථානයක් ඇති බව දේව වචනය පවසයි. '' ඔවුන්ගේ කෙළවර විනාශයය, ඔවුන් ගේ දෙවියෝ බඩය. ...... ඔවුන් සළකන්නේ ලෝකයේ දේවල් ය. ( පිලිප්පි 3 : 19 )
එහෙත් දෙවියන් වහන්සේ ප්‍රේමයේ දෙවියන් වහන්සේ වන බැවින්, සියල්ලන්ම පසුතැවිලි වනවාට මිස කිසිවෙක් විනාශ වෙනවාට උන්වහන්සේ නොකමැතිව.... බොහෝ කල් ඉවසන සේක. '' (2 පේත්‍රුස් 3 : 9) **එතුමන් ගේ** මහත් වූ ප්‍රේමයත් අනුකම්පාවත් නිසා ඕනෑකමින් සොයන්නා **වූ අයට ගැළවෙන මාර්ගය සාදා දී ඇත්තාහ. ඔබට එම ජීවනදායක මාර්ගය දැන ගැනීමට අවශ්‍ය ද?**

**ජීවනයේ මාර්ගය** - ගැළවුම්කාරයාණන් .(යේසුස් ක්‍රිස්තුස්වහන්සේ) : අපගේ පාපයෙන් අපට අපවම මුදාගත නොහැකි නිසාත් පාපයේ දඬුවම ගෙවිය නොහැකි නිසාත් දෙවියන් වහන්-සේ ගැළවුම්කාරයකු අප වෙත එවූ සේක. '' දෙවියන් වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහා ගන්න සැම දෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය. '' ( ශු.යොහාන් 3 : 16 ) දෙවියන් වහන්සේ එනම් ස්වර්ගීය පියාණන් වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස් වහන්-සේ මොළොවට එවා වදාළ සේක. එතුමන් මනුෂ්‍යයා කාරයෙන් සිටිය නමුත් කිසිදු පාපයක් නොකළ සේක. එතුමන් සියල්ලන්ට යහපත කළ සේක. යේසුස් වහන්සේ මෙලොව සිටි කාලය තුළ අංශභාග, අපස්මාර,අන්ධ, ගොළු, බිහිරි ආදි අනේකවිධ රෝගීන් සුවපත් කළ සේක. යක්ෂයන් අවේශව සිටියවුන් සුවපත් කළ සේක. පව් ගැන පසුතැවිලි වූවන්ට කමා කළ සේක. එසේම දෙවියන් වහන්සේ ගැන මනුෂ්‍යයන්ට කියා දුන් සේක.
එතුමන් මනුෂ්‍යයකු බවට පත්ව මෙළොව පැමිණීමේ ප්‍රධාන අභිලාෂය වූයේ අප සියල්ලන් වෙනුවෙන් එතුමන්ගේ ජීවිතය යාගයක් ලෙස පුද කිරීමයි. එතුමන්ගේ පාපයෙන් තොර දිව්‍යමය ජීවිතය. සහ එතුමන්ගේ අනර්ඝ ලේ අපගේ පාපයේ වන්දිය ලෙස ගෙවීමයි. දුෂ්ඨ මනුෂ්‍යයන් උන්වහන්සේව ඇදගෙන ගොස් කසයෙන් තලා අධිකව රුධිරය වහනය වන්නා වූ තුවාළ සිදු කිරීමට ඉඩ හළ සේක. අවසානයේ දී එතුමන්ගේ හිසමත කටු ඔටුන්නක් තබා කුරුසියක් මත අත් පා ඇණ ගසා ගාව්නා විදීමට එල්ලා තැබූහ. '' උන්වහන්සේම තමන්ගේ ශරීරයෙන් ගස පිට දී අපගේ පාපයන් ඉසුලූ සේක.'' ( 1 පේත්‍රුස් 2 : 24 ) එතුමන් ඔබත් මාත් වෙනුවෙන් දිවි පිදූ සේක.

**මළවුන්ගෙන් නැගිටීම හෙවත් උත්ථානය :** යේසුස් වහන්සේ දින තුනකට පසුව මරණය පරදා සො-හොනින් නැගිටි සේක. ඉක්බිති උන්වහන්සේ ගෝලයන්ට දර්ශනය වෙමින් ඔවුන් සමග කථා කළ සේක. ඉන් දින සතළිසකට පසුව ස්වර්ගයට ඔසවා ගනු ලැබ දෙවියන් වහන්සේගේ දකුණු පැත්තේ වැඩ හිඳ ගත් සේක. ( රෝම 8 : 34 ) "උන්වහන්සේ ස්වර්ගයෙහි ද, පොළවෙහි ද සියළු බලය හිමි සර්වපරාක්‍රම අධිකාරි බලය හිමි ජීවමාන ගැළවුම්කරුවාණන් වන සේක. ( මතෙව් 28 : 18 ) '' එබැවින් උන්වහන්සේ කරණා කොට ගෙන දෙවියන් වහන්සේ වෙත ළඟා වන්නන්

උදෙසා මැදහත්කම් කරන පිණිස උන්වහන්සේ නිරතුරුවම ජීවත් වන හෙයින් ඔවුන් කෙළවර දක්වාම ගළවන්ට උන්වහන්සේට පුළුවන.'' ( හෙබ්‍රෙව් 7 : 25 )

**ස්වර්ගය :** ස්වර්ගය යනු දෙවියන් වහන්සේ තම සියලු මහිමයෙන් යුක්තව ජීවත් වන්නා වූ ස්ථානයයි. '' මම නුඹලාට ස්ථානයක් පිළියෙල කරන පිණිස යමි. මම ගොස් නුඹලාට ස්ථානයක් පිළියෙල කරම් නම් මා සිටින තැන නුඹලාත් සිටින පිණිස මම නැවත ඇවිත් නුඹලා මා ළඟට ගන්නෙමි" ( යොහාන් 14: 2 - 3 )
එය ආශ්චර්යමත් ස්ථානයකි. එහි '' උන්වහන්සේ ඔවුන්ගේ ඇස් වලින් සියලු කඳුළු පිස දමන සේක. මරණය තවත් නොවන්නේය. වැලපීමත් හැඬීමත් වේදනාවත් තවත් නොවන්නේය. මක්නිසාද පළමු දේවල් පහව ගියේය. '' එහි රාත්‍රියක් නොවන්නේය. මක්නිසාද ස්වාමිවූ දෙවියන් වහන්සේ ඔවුන්ට ආලෝකය දෙන සේක.'' ( එළිදරව් 21 : 4, 22 : 5 ) එය ශුද්ධ වූ ස්ථානයකි. '' බැටළුපැටවාණන් ගේ ජීවන පොතෙහි ලියන ලද්දවුන් මිස අපවිත්‍ර දෙයක්වත් පිළිකුල් වූ දෙයක් කරන්නෙක්වත් කිසිසේත් එහි ඇතුල් නොවන්නේය." (එළිදරව් 21 : 27 )
ස්වර්ගයට යාමට **ඇත්තේ එකම මාර්ගයක්** පමණි. යේසුස් වහන්සේ මෙසේ පැවසූ සේක, '' **මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මමය. මා කරන කොටගෙන මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙතට පැමිණෙන්නේ නැත.** '' ( යොහාන් 14 : 6 ) '' **අපේ ගැළවීමට අවශ්‍ය වූ,** මනුෂ්‍යයන් අතරේ දෙන ලද **වෙන කිසි නාමයක්** ස්වර්ගයෙන් යට නැත්තේය. (ක්‍රියා 4 : 12)

## ස්වර්ගීය මාර්ගයේ යාමට පියවර තබන්නේ කෙසේ ද?

**1 -** ඔබ **පසුතැවිලිව** ( තම පාපය ගැන ) "යේසුස් වහන්සේගේ ශුභාරංචි කෙරෙහි අදහා ගන්න." (මාර්ක් 1 : 15)

**2 -** ඔබේ සියලු පව් බර සමග යාච්ඤාවෙන් (කන්නලව්වෙන්) **යේසුස් ක්‍රිස්තුස් වහන්සේ වෙතට පැමිණ** පාප සමාව ඉල්ලා සිටින්න. '' මා ළඟට එන තැනැත්තා මා විසින් කිසිසේත් අහක දමන්නේ නැත.'' ( යොහාන් 6 : 37 ) '' වෙහෙසවන්නා වූ බර උසුලන්නා වූ සියල්ලෙනි, මා වෙතට එන්න. මම නුඹලාට සහනය දෙන් නෙමි. '' ( මතෙව් 11 : 28 )

**3 - ඔබේ පව් වලින් මිදීම උදෙසා යේසුස් වහන්සේ කෙරෙහි පමණක් අදහන්න.** '' උන්වහන්සේගේ පුත්‍ර වූ යේසුස් වහන්සේගේ ලේ සියලු පාප වලින් අප පවිත්‍ර කරන්නේය. '' ( 1 යොහාන් 1 : 17 )

**4 - උන්වහන්සේ ඔබට නව ජීවිතයක් එනම් සදාකාල ජීවනය දෙන සේක.**'' "මාගේ වචන අසා මා එවූ තැනැන් වහන්සේ අදහන්නාට **සදාකාල ජීවනය තිබේ.** ඔහු විනිශ්චයට පත් නොවී **මරණය කෙරෙන් ජීවනයට පැමිණ** සිටියි.'' (යොහාන් 5:24) '' යමෙක් ක්‍රිස්තුස් වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය. පරණ දේ පහව ගියේය. මෙන්න සියල්ල අලුත් වී තිබේ. (2 කොරි: 5:17)

**5 -** ඔබගේ හදවත තුළ සමාදානය පවතිනු ඇත. '' නුඹලා වෙත සමාදානය තබා යමි. මාගේ සමාදානය නුඹලාට දෙමි." (යොහාන් 14 : 27) '' අපි ඇදහිල්ලෙන් ධර්මිෂ්ඨ කරනු ලැබ, අපේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කරණකොට ගෙන දෙවියන් වහන්සේ හා සමග සමාදානය ඇතුව සිටිමුව. '' ( රෝම 5 : 1) ඒ සාක්ෂිය නම් දෙවියන් වහන්සේ අපට **සදාකාල ජීවනය** දුන් බවය. තමන් පුත්‍රයාණන් දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්ගේ නාමය කෙරෙහි අදහ ගන්නා වූ නුඹලාට මේ දේ මා ලියා එව්වේ **නුඹලාට සදාකාල ජීවනය ඇති බව නුඹලා දැන ගන්න** පිණිසය. '' (1 යොහාන් 5:11-13)

## ( සදාකාල ජීවනය ඇත්තා වූ ) නව ජීවිතය ගත කරන්නේ කෙසේ ද?

**1 -** සෑම දිනකම **බයිබලය කියවන්න.** ඒ අපගේ ජීවිත මාර්ගයට ආලෝකයක් හා ආත්මික ජීවිතයට ආහාරයක් වනු ඇත.'' ඔබගේ වචනය මාගේ පාදයන්ට පහනක්ය. මාවතට එළියක්ය. (ගීතාවලිය 119 : 105 ) '' ආත්මික වූ අමිශ්‍ර වූ කිරි වලින් ( දේව වචනය ) නුඹලා ගැලවීම සඳහා වර්ධනය වන පිණිස අලුත උපන් බිළිඳුන් මෙන් එයට බොහෝ ආශා වෙයල්ලා. '' ( 1 පේත්‍රැස් 2 : 3 ) ඔබ බයිබලය කියවන කල්හි ශුද්ධාත්මයාණන් වහන්සේගේ මග පෙන්වීම හා එළිදරව්ව ඉල්ලා දෙවියන් වහන්සේට යාච්ඤා කරන්න.

**2 - දිනපතා යේසුස් වහන්සේගේ නාමයෙන් පිය වූ දෙවියන් වහන්සේ වෙත යාච්ඤා වෙන් ළඟා වන්න.''** නුඹලා කිසිවක් ගැන කණගාටු නොසිතා සියල්ලෙහි දී ස්තුති දීම සමග යාච්ඤාවෙන් ද කන්නලව් වෙන් ද නුඹලාගේ ඉල්ලීම් දෙවියන් වහන්සේට දන්වා පල්ලා. එවිට කිසි

නුවණකින් දැන ගත නොහැකි වූ දෙවියන් වහන්සේගේ සමාදානය ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ නුඹලාගේ සිත් ද සිතිවිලි ද ආරක්ෂා කරනවා ඇත. '' ( පිලිප්පි 4 : 6 - 7 )

**3 - "යේසුස් වහන්සේ ඔබට ලබා දුන් නව ජීවිතය ගැන අන්‍යයන්ට පවසන්න.** " නුඹ ගෙදර නුඹේ නෑ මිතුරන් ළඟට ගොස් ස්වාමීන් වහන්සේ නුඹට කොපමණ මහත් දේවල් කළ සේක් ද කියාත්, උන්වහන්සේ නුඹට කරුණා කළ හැටිත්, ඔවුන්ට දන්වා පන්නැයි ඔහුට කී සේක.'' (මාර්ක් 5:19 )

**4 - පරීක්ෂාවේ දී විපතේ දී, ස්වාමීන් වහන්සේට හඬ ගසන්න.** '' උන්වහන්සේ ම පරීක්ෂා කරනු ලැබ දුක් වින්ද බැවින්, පරීක්ෂා කරනු ලබන්නන්ට පිහිට වෙන්ට උන්වහන්සේට පුළුවන. '' (හෙබ්‍රෙව් 2:18) '' විපත්ති දවසේ දී මට හඬ ගසව, මම ඔබ මුදාහරින්නෙමි. ඔබ මට ගෞරව කරන්නෙහිය.'' (ගීතා: 50:15).

**5 - ඔබ යම් පාපයක් කරනු ලැබුවහොත් ඉක්මනින් පසුතැවිලිව දෙවියන්වහන්සේට පාපය කියා දී කමාව අයදින්න.** '' අපේ පාපවල් කියා දෙමු නම්, අපේ පව් අපට කමා කරන්නටත්, සියලු අධර්මිෂ්කමින් අප පවිත්‍ර කරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක.'' ( 1 යොහාන් 1 : 9 )

**6 - දේව වචනය නිවැරදිව දේශනා කරන්නා වූ සැබෑ කිතුණු සභාවක සහභාගිත්වය ලැබ එහි සිටින දේව දරුවන් සමග දේව ප්‍රේමය බෙදා ගන්න.** '' මාගේ ආඥාව නම් මා නුඹලාට ප්‍රේම කළාක් මෙන් නුඹලාත් එකිනෙකාට ප්‍රේම කරපල්ලා යනුය.'' ( යොහාන් 15 : 12 )

**7 - හැම විටම දෙවියන් වහන්සේගේ හඬට කීකරු වන්න.** '' යමෙක් මට ප්‍රේම කෙරේ නම්, ඔහු මාගේ වචනය රක්ෂා කරන්නේය.'' ( යොහාන් 14 : 23 )

**8 - යේසුස් වහන්සේ ඔබ සමග ඔබ තුළ සිටින හෙයින් කිසිවකට බිය නොවන්න.** '' මක්නිසාද මම කිසිසේත් නුඹෙන් අහක්ව නොයමි. කිසි අන්දමකින්වත් නුඹ අත්නොහරිමි යි උන්වහන්සේ ම කියා තිබේ.'' ( හෙබ්‍රෙව් 13 : 5 ) '' මම ද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමග සිටිමි'යි කී සේක.'' ( මතෙව් 28 : 20 )

**9 - ඔබ යේසුස් ක්‍රිස්තුන් වහන්සේට සම්පූර්ණයෙන් භාර වන්න. දේව කැමැත්ත අනුව ඔබගේ ජීවිතය හසුරු වන්න.** ඔබ එතුමන්ට ඉඩ හරින්න. මෙලෙස ඔබ එතුමන්ගේ පූර්ණ ආශිර්වාද පමණක් නොව ප්‍රීතියෙන් සමාදානයෙන් පිරි සදාකාල ජීවනයට යාමට ඔබට හැකි වනු ඇත. '' මෙසේ අපගේ ස්වාමිවූ ගැළවුම්කාරවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගේ සාදාකාල රාජ්‍යයට ඇතුල් වීම නුඹලාට බොහෝ සෙයින් දෙනු ලැබේ.'' (2 ප්‍රේතැස් 1 : 11)

---

Kindly write to us if you are able to assist us with further translations of our free Gospel literature, informing us of the language into which you could translate this Gospel literature. Your assistance would be appreciated.

If you have found salvation in Christ, or have been otherwise blessed through our Gospel literature, please let us know. We would like to thank God with you, and remember you further in our prayers.

For **free** Gospel literature, books and tracts in over 540 languages, write to:


EMAIL: info@angp.co.za

**ALL NATIONS GOSPEL PUBLISHERS**

**P.O. Box 2191, PRETORIA, 0001, R.S.A.**

(A Gospel Literature Mission financed by donations)

(Reg. No. 1961/001798/08)